සෞඛ්‍ය, දේශීය වෛද්‍ය, සමාජ සුභසාධන, පරිවාස හා ළමාරක්ෂක සේවා අමාත්‍යාංශය

# මධ්‍යම පළාත් ආයුර්වේද දෙපාර්තමේන්තුවේ

## ප්‍රාථමික ශ්‍රේණියේ අර්ධ ශිල්පීය PL 2 - 2016 සේවා ගණයේ තනතුරු සඳහා වන බඳවා ගැනීමේ හා උසස් කිරීමේ පරිපාටිය

ඉහත සඳහන් පරිපාටිය මධ්‍යම පළාත් ගරු ආණ්ඩුකාරතුමිය විසින් අනුමත කරනු ලබන දින සිට මධ්‍යම පළාත තුළ ක්‍රියාත්මක වේ. මධ්‍යම පළාත් ආයුර්වේද දෙපාර්තමේන්තුවේ ප්‍රාථමික - අර්ධ ශිල්පීය PL 2 – 2016 සේවා ගණයේ තනතුරු සඳහා වන මෙම පරිපාටිය මධ්‍යම පළාත් ගරු ආණ්ඩුකාරතුමිය විසින් අනුමත කළ දිනයේ සිට නව බඳවා ගැනීම සඳහා අදාළ වන අතර දෙපාර්තමේන්තුවේ දැනට සිටින සේවකයන් සම්බන්ධයෙන් අන්තර්ග්‍රහණ විධිවිධාන ද ඇතුළත් කර ඇත.

01. සම්බන්ධවන ආයතන

| | | | |
|---|---|---|---|
| 1.1 දෙපාර්තමේන්තුව | : | මධ්‍යම පළාත් සභාවේ ආයුර්වේද දෙපාර්තමේන්තුව.<br>යොමු අංකය: CPC/AYU/1/8/13/ii | දිනය : 2017.06.05 |
| 1.2 අමාත්‍යාංශය | : | මධ්‍යම පළාත් සෞඛ්‍ය, දේශීය වෛද්‍ය, සමාජ සුභ සාධන, පරිවාස හා ළමාරක්ෂක සේවා අමාත්‍යාංශය<br>යොමු අංකය : CPC/MH/01/16/04/24 | දිනය: 2017.06.28 |
| 1.3 කළමනාකරණ සේවා අධ්‍යක්ෂ ජනරාල් විසින් තනතුරු අනුමත කිරීම | : | යොමු අංකය:DMS/D/පොදු/11-2 | දිනය: 2012.12.19 |
| 1.4 මධ්‍යම පළාත් ප්‍රධාන ලේකම්ගේ නිර්දේශය. | : | යොමු අංකය : CPC/CS/2/3/S.M/H(V) | දිනය: 2017.07.24 |
| 1.5. වැටුප් කොමිෂන් සභාවේ නිර්දේශය. | : | යොමු අංකය: NSCC/10/71/3/SR | දිනය: 2018.01.09 |
| 1.6. මධ්‍යම පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ නිර්දේශය | : | යොමු අංකය: CPC/PSC/24/18/2017-1වෙළුම | දිනය : 2018.02.06 |

02. පත් කිරීමේ බලධරයා පිළිබඳ විස්තර

2.1 පත්කිරීමේ බලධරයා : මධ්‍යම පළාත් සෞඛ්‍ය, දේශීය වෛද්‍ය, සමාජ සුභ සාධන, පරිවාස හා ළමාරක්ෂක සේවා විෂය භාර අමාත්‍යාංශ ලේකම්

03. සේවා ගණය පිළිබඳ විස්තර :

3.1 සේවා ගණය : ප්‍රාථමික අර්ධ ශිල්පීය

3.2 ශ්‍රේණි : III, II, I සහ විශේෂ

3.3 පැවරෙන කාර්යයන් පිළිබඳ පොදු නිර්වචනය :

ආයතනයන්හි කාර්යයන් ඉටු කිරීම හා පවත්වා ගෙන යාමේදී අවශ්‍ය වන මූලික පහසුකම් සම්පාදනයට අදාළ වන උපස්ථායක සේවය, ඉදිකිරීම්, නඩත්තු හා අලුත්වැඩියා වැනි කාර්යයන් අතුරින් තෘතියික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් නිගමනය කරනු ලැබ ඇති පරිදි ජාතික වෘත්තීය කුසලතාවන්හි (N.V.Q) දෙවෙනි හෝ තුන්වැනි මට්ටමට නොඅඩු මට්ටමක ප්‍රවීණතා / කාර්මික නිපුණතාවන් අවශ්‍ය වන්නා වූ කාර්යයන් මෙම සේවා ගණයට පැවරේ. මෙම කාර්යයන් අතුරින් පත්කිරීමේ බලධරයා විසින් ඒ ඒ තනතුරට අදාළව විශේෂිත කොට දක්වනු ලබන කාර්යයන් තනතුරට පැවරේ.

ගරු ආණ්ඩුකාරතුමිය විසින්
2018.03.30 දින
අනුමත කරන ලදී.
ආණ්ඩුකාර ලේකම්

3.4 කාර්යයන් පැවරීම : ශ්‍රේණිගතව කාර්යයන් පැවරීමක් සිදු නොකරන අතර මෙම සේවා ගණය යටතේ වූ අදාළ තනතුරට නියමිත කාර්යයන් ඕනෑම ශ්‍රේණියක සේවකයෙකුට ආයතන ප්‍රධානියා විසින් පවරනු ලැබිය හැකිය.

04. තනතුරේ ස්වභාවය : ස්ථිර, විශ්‍රාම වැටුප් සහිත

05. වැටුප් :

5.1 වැටුප් කේත අංකය : PL 2 - 2016

5.2 වැටුප් පරිමාණය : රු.25250 -10x 270 -10x 300 -10x 330 -12x 350-38450

5.3 ශ්‍රේණි ක්‍රමය හා ශ්‍රේණි ක්‍රමයට අදාළ මාසික වැටුප් පියවර :

| ශ්‍රේණිය | ආරම්භක වැටුප් පියවර | වැටුප් තලය (රුපියල්) |
|---|---|---|
| III ශ්‍රේණිය | 01 පියවර | 25250/= |
| II ශ්‍රේණිය | 12 පියවර | 28250/= |
| I ශ්‍රේණිය | 22 පියවර | 31280/= |
| විශේෂ ශ්‍රේණිය | 32 පියවර | 34600/= |

5.4 වැටුප් ගෙවීම හා අනෙකුත් කරුණු රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 03/2016 හි විධිවිධාන අනුව විය යුතුය.

06. සේවා ගණයට අයත් තනතුර / තනතුරු

6.1 අනුමත තනතුරු නාම, අනුමත තනතුරු සංඛ්‍යාව හා ඒවාට පැවරෙන කාර්යයන් :

| අනුමත තනතුරු නාම | තනතුර අනුමත ශ්‍රේණි | අනුමත තනතුරු සංඛ්‍යාව | කාර්යයන් |
|---|---|---|---|
| යන්ත්‍ර ක්‍රියාකරු | III, II, I, විශේෂ | 01 | දේශීය ඖෂධ වර්ග සහ ඖෂධ සෑදීමට ගනු ලබන ද්‍රව්‍ය පිළිබඳව අවබෝධයක් ලබාගෙන බෙහෙත් ද්‍රව්‍ය යන්ත්‍රානුසාරයෙන් සකස් කිරීමට කටයුතු කිරීම, එම යන්ත්‍ර ක්‍රියාකරවීම, නඩත්තු කටයුතු සඳහා යොමු කිරීම, ඒවා නිසි පරිදි කළමනාකරණය කිරීම. |
| සුළු සේවා පාලක | III, II, I, විශේෂ | 01 | රෝහලට අනුයුක්ත සියළුම සුළු සේවකයන්ගේ රාජකාරි කටයුතු පරීක්ෂා කර බලා අදාළ නිලධාරින්ට වාර්තා කිරීම, සුළු සේවකයන් නියමිත ස්ථාන වල රාජකාරියට යෙදවීම. |
| උපස්ථායක / උපස්ථායිකා | III, II, I, විශේෂ | 72 | රෝගීන්ට උපස්ථාන කිරීම, රෝහලේ පවිත්‍රතාවය හා සුරක්ෂිතභාවය පවත්වා ගෙන යාම, වට්ටෝරු ලේඛන භාරව කටයුතු කිරීම, වෛද්‍ය හා හෙද නිලධාරින්ට සහාය වීම. |
| ආහාර නිරීක්ෂිකා | III, II, I, විශේෂ | 04 | රෝගීන්ට ආහාරපාන ලබාදීම සහ විශේෂ ලැයිස්තු සකස් කිරීම, ආහාර ද්‍රව්‍ය භාරගැනීම, නිකුත් කිරීම, නිසියාකාරව ආහාර බෙදා දෙන්නේද යන්න පරීක්ෂා කිරීම හා ඒ පිළිබඳ තොරතුරු සටහන් තබා ගැනීම, මුළුතැන්ගේ කටයුතු සොයා බැලීම, ආහාරපාන සම්බන්ධයෙන් ඉහළ නිලධාරින්ගේ නිර්දේශ මත අවශ්‍ය කටයුතු කිරීම. |
| ආයුර්වේද ඖෂධ සංයෝජක | III, II, I, විශේෂ | 31 | භෛසජ්ජකගේ අධීක්ෂණය යටතේ බෙහෙත් ශාලාවේ රාජකාරි කිරීම, ඖෂධ වල ලේබල් අලවා අසුරා තැබීම, ඖෂධාලය පිරිසිදු කර ආරක්ෂා කර ගැනීම, රෝගීන්ට ඖෂධ නිකුත් කිරීම හා ඒවා පාලනය. |

ගරු ආණ්ඩුකාරතුමිය විසින්
2018. 03. 30 දින
අනුමත කරන ලදී.
ආණ්ඩුකාර ලේකම්

6.2 ඒකාබද්ධ නිලධර සංඛ්‍යාව :

| | | |
|---|---|---|
| යන්ත්‍ර ක්‍රියාකරු | = | 01 |
| සුළු සේවා පාලක | = | 01 |
| උපස්ථායක / උපස්ථායිකා | = | 72 |
| ආහාර නිරීක්ෂිකා | = | 04 |
| ආයුර්වේද ඖෂධ සංයෝජක | = | 31 |

ශ්‍රේණියෙන් ශ්‍රේණියට උසස් කිරීමේ කාර්ය සඳහා III, II, I හා විශේෂ ශ්‍රේණිත් සියල්ල ඒකාබද්ධ නිලධර සංඛ්‍යාවට අයත් සේ සැලකේ.

## 07. බඳවා ගැනීමේ ක්‍රමය

### 7.1 බඳවා ගන්නා ප්‍රතිශතයන්

| ධාරාව | ප්‍රතිශතය |
|---|---|
| විවෘත | 30% |
| සීමිත | 70% |

- ❖ සටහන: යන්ත්‍ර ක්‍රියාකරු සුළු සේවා පාලක හා ආහාර නිරීක්ෂිකා සහ උපස්ථායක යන තනතුරු සඳහා පවතින පුරප්පාඩු සංඛ්‍යාව සීමිත බැවින් එම තනතුරු සඳහා සීමිත පදනම මත සුදුසුකම් සහිත අභ්‍යන්තර සේවකයන් අතුරින් බඳවා ගනු ලැබේ. එසේ නොමැති විට පමණක් බාහිර අයදුම්කරුවන්ගෙන් අයදුම්පත් කැඳවා විවෘත පදනම මත බඳවා ගනු ලැබේ.

### 7.2 විවෘත බඳවා ගැනීම

7.2.1 බඳවා ගන්නා ශ්‍රේණිය : III ශ්‍රේණිය

7.2.2 සුදුසුකම :

7.2.2.1 අධ්‍යාපන සුදුසුකම් : අධ්‍යයන පොදු සහතික පත්‍ර සාමාන්‍ය පෙළ විභාගයෙන් දෙවරකට නොවැඩි වාර ගණනකදී යටත් පිරිසෙයින් සම්මාන දෙකක් සහිතව විෂයයන් හයක් සමත්ව තිබීම.

7.2.2.2 වෘත්තීය සුදුසුකම්:

<table>
<tr><th>තනතුර</th><th>සුදුසුකම්</th></tr>
<tr><td>යන්ත්‍ර ක්‍රියාකරු</td><td rowspan="5">තනතුරට අදාළව තෘතියික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් නිගමනය කරනු ලැබ ඇති පරිදි ජාතික වෘත්තීය කුසලතාවන්හි (N.V.Q) දෙවන හෝ තුන්වන මට්ටමට නොඅඩු මට්ටමක අදාළ වෘත්තීය පාඨමාලාව හදාරා සහතිකය ලබා තිබීම</td></tr>
<tr><td>සුළු සේවා පාලක</td></tr>
<tr><td>උපස්ථායක / උපස්ථායිකා</td></tr>
<tr><td>ආහාර නිරීක්ෂිකා</td></tr>
<tr><td>ආයුර්වේද ඖෂධ සංයෝජක</td></tr>
</table>

ගරු ආණ්ඩුකාරතුමිය විසින්
2018.03.30 දින
අනුමත කරන ලදී.
ආණ්ඩුකාර ලේකම්

7.2.2.3 පළපුරුද්ද : i. අදාළ ක්ෂේත්‍රයේ ලබා ඇති පළපුරුද්ද විශේෂ සුදුසුකමක් ලෙස සැලකේ.

ii. ආයුර්වේද ඖෂධ සංයෝජක තනතුර සඳහා පමණක් අදාළ ක්ෂේත්‍රයේ වසර දෙක(02)ක පළපුරුද්දක් තිබිය යුතුය.

7.2.2.4 කායික සුදුසුකම් : සෑම අපේක්ෂකයෙකුම මධ්‍යම පළාතේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමටත් තනතුරේ රාජකාරි ඉටු කිරීමටත් ප්‍රමාණවත් ශාරීරික හා මානසික යෝග්‍යතාවයෙන් යුක්ත විය යුතුය.

7.2.2.5 වෙනත් : i. ශ්‍රී ලංකාවේ පුරවැසියෙකු විය යුතුය.

ii. අයදුම්කරුවන් විශිෂ්ඨ චරිතයකින් යුක්ත විය යුතුය.

iii. තනතුරට බඳවා ගැනීම සඳහා අයදුම්පත් කැඳවීමේ නිවේදනයේ ගැසට් පත්‍රයේ සඳහන් කරනු ලබන දිනට සියලු සුදුසුකම් සෑම ආකාරයකින්ම සම්පූර්ණ කර තිබිය යුතුය.

iv. බඳවා ගනු ලබන දිනට මධ්‍යම පළාතේ පූර්වාසන්න වසර තුනක(03) ස්ථිර පදිංචිය තහවුරු කළ යුතුය.

7.2.3 වයස:

7.2.3.1 අවම සීමාව : අවුරුදු 18 ට නොඅඩු

7.2.3.2 උපරිම සීමාව : අවුරුදු 45ට නොවැඩි විය යුතුය.

7.2.4 බඳවා ගැනීමේ ක්‍රමය : වෘත්තිය පරීක්ෂණයකින් හා ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයකින් ලබාගන්නා ලකුණු වල කුසලතා අනුපිළිවෙල අනුව පවතින පුරප්පාඩු සංඛ්‍යාවට බඳවා ගනු ලැබේ.

7.2.4.1 වෘත්තිය පරීක්ෂණය :

| විෂයයන් | උපරිම ලකුණු ප්‍රමාණය | සමත් උපරිම ලකුණු ප්‍රමාණය |
|---|---|---|
| විෂයානුබද්ධ දැනුම | 50 | අදාළ නොවේ. |

7.2.4.2. පවත්වන බලධරයා : මධ්‍යම පළාත් සෞඛ්‍ය හා දේශීය වෛද්‍ය විෂය භාර අමාත්‍යාංශයේ ලේකම් විසින් පත් කරනු ලබන පරීක්ෂණ මණ්ඩලයක් විසින්

7.2.4.3 ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණය

| පරීක්ෂා කර බලා ලකුණු ලබා දෙනු ලබන ක්ෂේත්‍ර | උපරිම ලකුණු ප්‍රමාණය | සමත් උපරිම ලකුණු ප්‍රමාණය |
|---|---|---|
| අතිරේක අධ්‍යාපන සුදුසුකම් | 15 | අදාළ නොවේ. |
| අදාළ ක්ෂේත්‍රයේ පළපුරුද්ද | 30 | |
| සම්මුඛ පරීක්ෂණයේදි දක්වන කුසලතාවය | 05 | |

7.2.4.3.1 ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණ මණ්ඩලය පත් කරන බලධරයා : මධ්‍යම පළාත් සෞඛ්‍ය හා දේශීය වෛද්‍ය විෂය භාර අමාත්‍යාංශයේ ලේකම්

7.2.4.4 සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණය: ලකුණු ලබා දෙනු නොලැබේ

7.2.5 අයදුම්පත් කැඳවීමේ ක්‍රමය : රජයේ ගැසට් පත්‍රයේ දැන්වීම පළ කිරීම හෝ ප්‍රසිද්ධ පුවත්පත් දැන්වීම් පළ කිරීම මගින් හෝ පළාත් සෞඛ්‍ය අමාත්‍යාංශයේ නිල වෙබ් අඩවියේ දැන්වීම් පළ කිරීම මගින් අයදුම්පත් කැඳවනු ලැබේ.

ගරු ආණ්ඩුකාරතුමිය විසින්
2018.03.30 දින
අනුමත කරන ලදී.
ආණ්ඩුකාර ලේකම්

7.3 සීමිත බඳවා ගැනීම

7.3.1 බඳවා ගන්නා ශ්‍රේණිය :අදාළ තනතුරේ III ශ්‍රේණියේ පිහිටවනු ලැබේ.

7.3.2 සුදුසුකම්:

7.3.2.1 අධ්‍යාපන සුදුසුකම් : අ.පො.ස. (සා.පෙළ) විභාගයෙන් දෙවරකට නොවැඩි වාර ගණනකදී යටත් පිරිසෙයින් සම්මාන 2 ක් සහිතව විෂයන් 06 ක් සමත්වීම

❖ සංලක්ෂය : සීමිත බඳවා ගැනීමේදී, 2006.01.01 දිනට පෙර මධ්‍යම පළාත් ආයුර්වේද දෙපාර්තමේන්තුවේ කම්කරු සේවයේ ස්ථිර තනතුරක සේවය කල සේවකයන් සඳහා පමණක් ඉහත අධ්‍යාපන සුදුසුකම් අට (8) වන වසර සමත් වීම ලෙස සැලකේ.

7.3.2.2 වෘත්තීය සුදුසුකම් :අදාළ නොවේ.

7.3.2.3 පළපුරුද්ද : මධ්‍යම පළාත් ආයුර්වේද දෙපාර්තමේන්තුවට අයත් PL 1 හෝ PL2 තනතුරක වසර පහකට (5) නොඅඩු සේවාකාලයක් සම්පූර්ණ කර තිබීම.

7.3.2.4 කායික සුදුසුකම් : සෑම අපේක්ෂකයෙකුම මධ්‍යම පළාතේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමටත් තනතුරේ රාජකාරි ඉටු කිරීමටත් ප්‍රමාණවත් ශාරීරික හා මානසික යෝග්‍යතාවයෙන් යුක්ත විය යුතුය.

7.3.2.5 වෙනත් :

i. අයදුම්පත් කැඳවන දිනට ආයුර්වේද දෙපාර්තමේන්තුවට අයත් ස්ථිර තනතුරක පූර්වාසන්නතම වසර 05ක සක්‍රිය හා සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම.

ii. සේවය ස්ථිර කර තිබීම.

iii. අයදුම්පත් කැඳවීමේ නිවේදනයේ / ගැසට් පත්‍රයේ සඳහන් දිනට තනතුරට බඳවා ගැනීම සඳහා අවශ්‍ය සියලු සුදුසුකම් සෑම ආකාරයකින්ම සම්පූර්ණ කර තිබිය යුතුය.

7.3.3 වයස : සීමිත බඳවා ගැනීමේදී උපරිම වයස් සීමාව අදාළ නොවේ

7.3.4 බඳවා ගැනීමේ ක්‍රමය :වෘත්තීය පරීක්ෂණයකින් හා ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයකින් ලබා ගන්නා ලකුණු වල කුසලතා අනුපිළිවෙල අනුව පවතින පුරප්පාඩු සංඛ්‍යාවට බඳවා ගනු ලැබේ.

7.3.4.1 වෘත්තීය පරීක්ෂණය : ඇමුණුම 01

| විෂයයන් | උපරිම ලකුණු ප්‍රමාණය | සමත්වීම සඳහා ලබා ගත යුතු ලකුණු ප්‍රමාණය |
|---|---|---|
| විෂයානුබද්ධ දැනුම | 50 | අදාළ නොවේ. |

7.3.4.1.1 පවත්වන බලධරයා : මධ්‍යම පළාත් සෞඛ්‍ය හා දේශීය වෛද්‍ය විෂය භාර අමාත්‍යාංශයේ ලේකම්

ගරු ආණ්ඩුකාරතුමිය විසින්
2018.03.30 දින
අනුමත කරන ලදී.
ආණ්ඩුකාර ලේකම්

7.3.4.2 වාචික සම්මුඛ පරීක්ෂණය

| පරීක්ෂා කර බලා ලකුණු ලබා දෙනු ලබන ක්ෂේත්‍ර | උපරිම ලකුණු ප්‍රමාණය | සමත්වීම සඳහා ලබා ගත යුතු ලකුණු ප්‍රමාණය |
|---|---|---|
| අතිරේක අධ්‍යාපන සුදුසුකම් | 15 | අදාළ නොවේ. |
| අදාළ ක්ෂේත්‍රයේ දැනුම හා පළපුරුද්ද පිළිබඳ වාචික පරීක්ෂණය | 30 | |
| සම්මුඛ පරීක්ෂණයේදී දක්වන කුසලතාවය | 05 | |
| ජ්‍යෙෂ්ඨතාවය | 50 | |

7.3.4.2.1 වාචික සම්මුඛ පරීක්ෂණ මණ්ඩලය පත් කරන බලධරයා :
මධ්‍යම පළාත් සෞඛ්‍ය හා දේශීය වෛද්‍ය විෂය භාර අමාත්‍යාංශයේ ලේකම්

7.3.5 අයදුම්පත් කැඳවීමේ ක්‍රමය : මධ්‍යම පළාත් සෞඛ්‍ය හා දේශීය වෛද්‍ය විෂය භාර අමාත්‍යාංශයේ ලේකම් අභ්‍යන්තරව පල කරනු ලබන දැන්වීමක් මගින් හා අමාත්‍යාංශ නිල වෙබ් අඩවියෙහි පල කරනු ලබන දැන්වීමක් මගින්

08. කාර්යක්ෂමතා කඩඉම්

8.1

| කුමන කාර්යක්ෂමතා කඩඉමද යන වග | කාර්යක්ෂමතා කඩඉම සමත් විය යුත්තේ කොපමණ වසර ගණනකට පෙරද | කාර්යක්ෂමතා කඩඉමේ ස්වභාවය ලිඛිත පරීක්ෂණය/ වෘත්තීය පරීක්ෂණය/ සහතික පාඨමාලාව/ වෙනත් |
|---|---|---|
| 1 වන කාර්යක්ෂමතා කඩඉම | III ශ්‍රේණියට බඳවාගෙන වසර 03ක් ගතවීමට පෙර | ලිඛිත පරීක්ෂණයකි ඇමුණුම 02 |
| 2 වන කාර්යක්ෂමතා කඩඉම | II ශ්‍රේණියට උසස් වී වසර 03ක් ගතවීමට පෙර | ලිඛිත පරීක්ෂණයකි ඇමුණුම 03 |
| 3 වන කාර්යක්ෂමතා කඩඉම | I ශ්‍රේණියට උසස් වී වසර 05 ක් ගතවීමට පෙර | ලිඛිත පරීක්ෂණයකි ඇමුණුම 04 |

(විෂය නිර්දේශය ඇමුණුම් 02,03 සහ 04 වශයෙන් යා කර ඇත.)

8.2 කාර්යක්ෂමතා කඩඉම පවත්වනු ලබන්නේ කොපමණ කාලයකට වරක්ද : වර්ෂයකට දෙවරක්

8.3 කාර්යක්ෂමතා කඩඉම් වලට අදාළ පරීක්ෂණය පවත්වනු ලබන බලධරයන් කවුරුන්ද :
මධ්‍යම පළාත් සෞඛ්‍ය හා දේශීය වෛද්‍ය විෂය භාර අමාත්‍යාංශයේ ලේකම් විසින් පත් කරනු ලබන පරීක්ෂණ මණ්ඩලයක් විසින්.

09. රාජ්‍ය භාෂා ප්‍රවීණතාව

9.1

| භාෂාව | ලබා ගත යුතු ප්‍රවීණතාව |
|---|---|
| 01. රාජ්‍ය භාෂාව | රාජ්‍ය භාෂාවක් නොවන මාධ්‍යයකින් සේවයට බැඳුණු සේවකයන් විසින් රාජ්‍ය භාෂා ප්‍රවීණතාවය පරිවාස කාලය තුළ ලබා ගත යුතුය. |
| 02. අනෙක් රාජ්‍ය භාෂාව | රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 01/2014 හා ඊට අනුෂාංගික චක්‍රලේඛ අනුව අදාළ මට්ටමේ භාෂා ප්‍රවීණතාව ලබා ගත යුතුය. |

ගරු ආණ්ඩුකාරතුමිය විසින්
2018.03.30 දින
අනුමත කරන ලදී.
ආණ්ඩුකාර ලේකම්

## 10. ශ්‍රේණි උසස් කිරීම

### 10.1 III වන ශ්‍රේණියේ සිට II වන ශ්‍රේණියට උසස් කිරීම

#### 10.1.1 සාමාන්‍ය මට්ටමේ කාර්ය සාධනය පෙන්නුම් කරන්නන් :

10.1.1.1 සපුරාලිය යුතු සුදුසුකම් :

i. පත්වීම ස්ථිර කර තිබීම.

ii. සේවා ගණයේ III ශ්‍රේණියේ අවම වශයෙන් වසර 10ක සක්‍රිය හා සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කරතිබීම හා වැටුප් වර්ධක දහයක් (10) උපයාගෙන තිබීම.

iii. අනුමත කාර්ය සාධන ඇගයීමේ පටිපාටිය අනුව උසස් කිරීමේ දිනට පෙරාතුව වූ වසර දහයක් (10) තුළ සතුටුදායක හෝ ඊට ඉහළ කාර්ය සාධනයක් පෙන්නුම් කර තිබීම.

iv. උසස් කිරීමේ දිනට පූර්වාසන්න වසර 5ක සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම.

v. අදාළ මට්ටමේ අනෙක් රාජ්‍ය භාෂා ප්‍රවීණතාවය ලබාගෙන තිබීම.

vi. අදාළ කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය නියමිත දිනට සමත්ව තිබීම.

10.1.1.2 උසස් කිරීමේ ක්‍රමය :

සුදුසුකම් සම්පූර්ණ කරන සේවකයන් විසින් දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ නිර්දේශ සහිත ඇමුණුම් 05 හි සඳහන් නියමිත ආකෘති පත්‍රය මගින් පත්වීම් බලධරයා වෙත ඉල්ලීමක් කරනු ලැබූ විට පත්වීම් බලධාරියා විසින් සුදුසුකම් පරීක්ෂා කිරීමෙන් අනතුරුව සුදුසුකම් ලබන දින සිට ක්‍රියාත්මක වන පරිදි II වන ශ්‍රේණියට උසස් කිරීම සිදු කරනු ලැබේ.

### 10.2 II වන ශ්‍රේණියේ සිට I වන ශ්‍රේණියට උසස් කිරීම

#### 10.2.1 සාමාන්‍ය මට්ටමේ කාර්ය සාධනය පෙන්නුම් කරන්නන් :

10.2.1.1 සපුරාලිය යුතු සුදුසුකම් :

I. සේවා ගණයේ II ශ්‍රේණියේ අවම වශයෙන් වසර නවයක (09) සක්‍රිය හා සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම හා වැටුප් වර්ධක නවයක් (09) උපයාගෙන තිබීම.

II. අනුමත කාර්ය සාධන ඇගයීමේ පරිපාටිය අනුව උසස් කිරීමේ දිනට පෙරාතුව වූ වසර නවයක් (09) තුළ සතුටුදායක මට්ටමේ හෝ ඊට ඉහළ කාර්ය සාධනයක් පෙන්නුම් කර තිබීම.

III. දෙවන(2) කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය නියමිත දිනට සමත්ව තිබීම.

IV. උසස් කිරීමේ දිනට පූර්වාසන්න වසර 05ක සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම.

10.2.1.2 උසස් කිරීමේ ක්‍රමය: සුදුසුකම් සම්පූර්ණ කරන සේවකයන් විසින් දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ නිර්දේශය සහිත ඇමුණුම් 06හි සඳහන් ආකෘති පත්‍රයෙන් පත්වීම් බලධාරියා වෙත ඉල්ලීමක් කරනු ලැබූ විට පත්වීම් බලධාරියා විසින් සුදුසුකම් පරීක්ෂා කිරීමෙන් අනතුරුව සුදුසුකම් ලබන දින සිට ක්‍රියාත්මක වන පරිදි I වන ශ්‍රේණියට උසස් කිරීම සිදු කරනු ලැබේ.

ගරු ආණ්ඩුකාරතුමිය විසින්
2018.03.30 දින
අනුමත කරන ලදී.
ආණ්ඩුකාර ලේකම්

10.3 I ශ්‍රේණියේ සිට විශේෂ ශ්‍රේණියට උසස් කිරීම :

10.3.1 සපුරාලිය යුතු සුදුසුකම් :

i. සේවා ගණයේ I ශ්‍රේණියේ අවම වශයෙන් වසර නවයක (09) සක්‍රිය හා සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම හා වැටුප් වර්ධක නවයක් (09) උපයාගෙන තිබීම.

ii. උසස් කිරීමේ දිනට පූර්වාසන්නතම වසර පහ (05) තුළ සක්‍රිය හා සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම.

iii. අනුමත කාර්ය සාධන ඇගයීමේ පටිපාටිය අනුව උසස් කිරීමේ දිනට පෙරාතුව වූ වසර නවයක් (09) තුළ සතුටුදායක මට්ටමේ හෝ ඊට ඉහළ කාර්ය සාධනයක් පෙන්නුම් කර තිබීම.

iv. අදාළ කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය නියමිත දිනට සමත්ව තිබීම.

10.3.2 උසස් කිරීමේ ක්‍රමය :

සුදුසුකම් සම්පූර්ණ කරන සේවකයන් විසින් දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ නිර්දේශ සහිත ඇමුණුම 07 හි සඳහන් ආකෘති පත්‍රයෙන් පත් කිරීමේ බලධාරියා වෙත ඉල්ලීමක් කරනු ලැබූ විට පත් කිරීමේ බලධාරියා විසින් සුදුසුකම් පරීක්ෂා කිරීමෙන් අනතුරුව සුදුසුකම් ලබන දින සිට ක්‍රියාත්මක වන පරිදි විශේෂ ශ්‍රේණියට උසස් කිරීම සිදු කරනු ලැබේ.

සංලක්ෂය: සාමාන්‍ය මට්ටමේ කාර්ය සාධනය අනුව උසස් කිරීමේදී නියමිත දිනට කාර්යක්ෂමතා කඩඉම සමත් නොවන නිලධාරින්ගේ උසස්වීම් දිනය කාර්යක්ෂමතා කඩඉම සමත්වීමට ප්‍රමාද වූ කාලයට සමාන කාලයකින් ප්‍රමාද කළ යුතුය.

11. තනතුරුවලට පත් කිරීම : අදාළ නොවේ.

12. අන්තර්ග්‍රහණ විධිවිධාන: සේවයේ යෙදී සිටින්නන් නව ශ්‍රේණි ක්‍රමය සඳහා අන්තර්ග්‍රහණය කරන ක්‍රමවේදය ඇමුණුම් අංක 09 හි දැක්වේ.

13. අර්ථ නිරූපන:

13.1 "ආණ්ඩුකාරතුමිය"යන්නෙන් මධ්‍යම පළාතේ ගරු ආණ්ඩුකාරතුමිය / තුමා අදහස් වේ.

13.2 "කොමිෂන් සභාව" යන්නෙන් මධ්‍යම පළාත් සභාවේ රාජ්‍ය සේවා කොමිෂන් සභාව අදහස් වේ.

13.3 "පත් කිරීමේ බලධාරියා" යන්නෙන් මධ්‍යම පළාත් සභාවේ සෞඛ්‍ය හා දේශීය වෛද්‍ය විෂය භාර අමාත්‍යාංශයේ ලේකම්වරයා අදහස් වේ.

13.4 "අමාත්‍යාංශ ලේකම්වරයා " යන්නෙන් මධ්‍යම පළාත් සෞඛ්‍ය හා දේශීය වෛද්‍ය විෂය භාර අමාත්‍යාංශයේ ලේකම්වරයා අදහස් වේ.

13.5 "දෙපාර්තමේන්තු ප්‍රධානියා" යන්නෙන් මධ්‍යම පළාත් ආයුර්වේද දෙපාර්තමේන්තුවේ පළාත් ආයුර්වේද කොමසාරිස්වරයා අදහස් වේ.

13.6 "ආයතන ප්‍රධානියා" යන්නෙන් මධ්‍යම පළාත් ආයුර්වේද දෙපාර්තමේන්තුව යටතේ ඇති යම් ආයතනයක තත් කාලයේ ආයතනය භාරව කටයුතු කරනු ලබන ප්‍රධානියකු අදහස් වේ.

13.7 "සක්‍රිය සේවා කාලය" යනු ස්වකීය තනතුරට අදාළ වැටුප් ලබමින් සත්‍ය වශයෙන්ම රාජකාරියෙහි යෙදී සිටි සේවා කාලය වේ. රජයෙන් අනුමත ප්‍රසූත නිවාඩු හැර අනෙකුත් සියලුම වැටුප් රහිත නිවාඩු කාල පරිච්ඡේදයන් සක්‍රිය සේවා කාලය සඳහා ගණනය කරනු නොලබන්නේය.

ගරු ආණ්ඩුකාරතුමිය විසින්
2018. 03. 30 දින
අනුමත කරන ලදී.
ආණ්ඩුකාර ලේකම්

13.8 “සතුටුදායක සේවා කාලය” යනුවෙන් අදහස් කරනුයේ,

(i) රජයේ නිලධරයකු විසින් කාර්යක්ෂමව හා අනලස්ව රාජකාරි ඉටු කිරීම මගින්ද, සිදුකල යුතුව තිබූ පත්වීම් ස්ථිර කිරීම සඳහා අවශ්‍ය සුදුසුකම් සම්පූර්ණ කිරීම මගින්ද, එම කාලය තුළදී උපයාගත යුතුව තිබූ සියලුම වැටුප් වර්ධක උපයාගෙන ඇත්තා වූ සහ දඬුවම් ලැබිය යුතු වරදක් සිදු නොකරන ලද්දා වූ කාල සීමාවක් වන්නේය.

(ii) නිලධරයා වෙත ලබාදිය යුතුව තිබූ වාර්ෂික වැටුප් වර්ධක නීත්‍යානුකූල හේතු මත අත්හිටුවා, අඩුකොට, නතර කොට හෝ විලම්බනය කොට ඇති කාලපරිච්ඡේදයක් වේ නම් එයද, ආයතන සංග්‍රහයේ II කොටසේ වැරදි පිළිබඳව පළමුවැනි උපලේඛනය යටතේ දඬුවම් ලැබිය හැකි වරදක් සිදුකර ඇති විටෙක එම වරද සිදු කරනු ලැබූ දින සිට වසර 03ක කාලයක් ද සහ ආයතන සංග්‍රහයේ II කොටසේ වැරදි පිළිබඳව දෙවන උපලේඛනය යටතේ දඬුවම් ලැබිය හැකි වරදක් සිදුකර ඇති විටක එම වරද සිදුකරනු ලැබූ දින සිට එක් වසරක කාලයක් ද සතුටුදායක සේවා කාලය ගණනය කිරීමේදී බැහැර කළ යුතු වන්නේය.

14. සෑම පත්වීමක් සම්බන්ධයෙන්ම ආයතන සංග්‍රහයේ විධිවිධාන, මුදල් රෙගුලාසි සහ රජය / මධ්‍යම පළාත් සභාව විසින් කලින් කලට පනවනු ලබන නීති රීති හා රෙගුලාසි අදාළ වේ.



ගරු ආණ්ඩුකාරතුමිය විසින්
2018.03.30 දින
අනුමත කරන ලදී.
ආණ්ඩුකාර ලේකම්

15. මෙම බඳවා ගැනීම් පරිපාටියේ සඳහන් යම් කරුණක් සම්බන්ධයෙන් හෝ විධිවිධාන සලසා නොමැති යම් කරුණක් සම්බන්ධයෙන් පැන නඟින ගැටළුවකදී මධ්‍යම පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් ගරු ආණ්ඩුකාරතුමිය/තුමා විමසා ගරු ආණ්ඩුකාරතුමියගේ/තුමාගේ අනුමැතිය පරිදි තීරණය කරනු ලැබේ.

මධ්‍යම පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ නිර්දේශය:

| | නම | | අත්සන |
|---|---|---|---|
| 01. | ගාමිණී දසනායක මහතා | (සභාපති) | ........................ |
| 02. | ජී.ජී.එස්.ජී. දිසානායක මහත්මිය | (සාමාජික) | ........................ |
| 03. | වී. නන්දකුමාර් මහතා | (සාමාජික) | ........................ |
| 04. | ඒ.ජේ.එම්.එම්. නිස්තාර් මහතා | (සාමාජික) | ........................ |
| 05. | ඩබ්.එම්.එස්.ඩී. වීරකෝන් මහතා | (සාමාජික) | ........................ |

දිනය: 2018.02-06

ආණ්ඩුකාර ලේකම්,

2018.02.06 දිනැති කොමිෂන් සභා වාර්තාවේ අංක 18/136 යටතේ කොමිෂන් සභාව විසින් නිර්දේශ කරන ලද මධ්‍යම පළාත් ආයුර්වේද දෙපාර්තමේන්තුවේ රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 03/2016 අනුව PL 2-2016 වැටුප් පරිමාණය හිමි ප්‍රාථමික අර්ධ ශිල්පීය තනතුරු සඳහා බඳවා ගැනීමේ හා උසස් කිරීමේ පරිපාටිය ගරු ආණ්ඩුකාරතුමියගේ අනුමැතිය සඳහා කාරුණිකව ඉදිරිපත් කරමි.

දිනය, 2018.02.26 ........................................

ලේකම්,
මධ්‍යම පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව.

නිල මුද්‍රාව

ආර්. එම්. එන්. රත්නායක
ලේකම්
පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව
මධ්‍යම පළාත

අනුමත කරමි / නොකරමි.

........................................
මධ්‍යම පළාත් ගරු ආණ්ඩුකාරතුමිය

දිනය: ........................

අනුමත කරමි / නොකරමි

........................................
නිලූකා ඒකනායක
මධ්‍යම පළාත් ආණ්ඩුකාරවර
2018/03/30

විෂය නිර්දේශය

ඇමුණුම 01

බඳවා ගැනීමේ හා උසස් කිරීමේ පටිපාටියෙහි 7:2:4:1 වගන්තිය හා7.3.4.2 වගන්තිය අදාළ වේ.

වෘත්තීය පරීක්ෂණය පිළිබඳ ආකෘතිය

01. වෘත්තීය පරීක්ෂණය පැවැත්වීමට අදාළ කරුණ : මධ්‍යම පළාත් ආයුර්වේද දෙපාර්තමේන්තුවෙහි ප්‍රාථමික - අර්ධ ශිල්පීය සේවා ශ්‍රේණියේ විවෘත / සීමිත බඳවා ගැනීම.

02. ලකුණු ලබා දිය යුතු ක්ෂේත්‍ර

යන්ත්‍ර ක්‍රියාකරු

| විෂයයන් | උපරිම ලකුණු ප්‍රමාණය | සමත්වීම සඳහා ලබා ගත යුතු ලකුණු ප්‍රමාණය |
|---|---|---|
| ඖෂධ නිෂ්පාදන ක්ෂේත්‍රයට අදාළ මූලික දැනුම. | 15 | අදාළ නොවේ |
| ඖෂධ නිෂ්පාදනයට අදාළ යන්ත්‍රෝපකරණ සවි කිරීම, ක්‍රියාකරවීම පිළිබඳ දැනුම. | 10 | |
| දේශීය ඖෂධ වර්ග හා ඖෂධ සෑදීමට ගන්නා ද්‍රව්‍ය පිළිබඳ දැනුම. | 10 | |
| බෙහෙත් යන්ත්‍රානුසාරයෙන් සකස් කිරීම සම්බන්ධ දැනුම. | 15 | |

සුළුසේවා පාලක

| විෂයයන් | උපරිම ලකුණු ප්‍රමාණය | සමත්වීම සඳහා ලබා ගත යුතු ලකුණු ප්‍රමාණය |
|---|---|---|
| සේවකයන්ගේ පැමිණීම සම්බන්ධ වාර්තා සකස් කිරීමේ හැකියාව. | 20 | අදාළ නොවේ |
| සුලු සේවකයන් නියමිත ස්ථාන වල රාජකාරියේ යෙදවීමේ හැකියාව. | 20 | |
| සේවකයන්ගේ රාජකාරි සම්බන්ධ සුළු ගැටලු නිරාකරණය කිරීමේ හැකියාව. | 10 | |

උපස්ථායක / උපස්ථායිකා

| විෂයයන් | උපරිම ලකුණු ප්‍රමාණය | සමත්වීම සඳහා ලබා ගත යුතු ලකුණු ප්‍රමාණය |
|---|---|---|
| රෝගීන් සම්බන්ධව කටයුතු කිරීමේ හැකියාව. | 15 | අදාළ නොවේ |
| රෝගීන්ට උපස්ථාන කිරීම පිළිබඳ දැනුම. | 25 | |
| ඖෂධ සම්බන්ධ දැනුම හා ඖෂධ භාවිතය සම්බන්ධ මූලික දැනුම. | 10 | |

ආහාර නිරීක්ෂිකා

| විෂයයන් | උපරිම ලකුණු ප්‍රමාණය | සමත්වීම සඳහා ලබා ගත යුතු ලකුණු ප්‍රමාණය |
|---|---|---|
| රෝගීන්ට අවශ්‍ය ආහාරපාන ලැයිස්තු සකස් කිරීමේ හැකියාව. | 25 | අදාළ නොවේ |
| ආහාර ද්‍රව්‍ය භාරගැනීම, නිකුත් කිරීම, බෙදා හැරීම සම්බන්ධ දැනුම. | 15 | |
| නියමිත ප්‍රමාණයට ආහාර සැකසීම පිළිබඳ දැනුම. | 10 | |

ගරු ආණ්ඩුකාරතුමිය විසින්
2018.03.30 දින
අනුමත කරන ලදී.
ආණ්ඩුකාර ලේකම්

ආයුර්වේද ඖෂධ සංයෝජක

| විෂයයන් | උපරිම ලකුණු ප්‍රමාණය | සමත්වීම සඳහා ලබා ගත යුතු ලකුණු ප්‍රමාණය |
|---|---|---|
| දේශීය ඖෂධ සංයෝජනය කිරීමේ හැකියාව<br>දේශීය ඖෂධ අසුරා තැබීම හා ආරක්ෂා කිරීම<br>දේශීය ඖෂධ නිකුත් කිරීම සම්බන්ධ දැනුම | 20<br>20<br>10 | අදාළ නොවේ |

03. විභාගය පවත්වනු ලබන බලධරයා : පළාත් සෞඛ්‍ය හා දේශීය වෛද්‍ය විෂය භාර අමාත්‍යාංශයේ ලේකම්

04. පවත්වනු ලබන්නේ කොපමණ කාල සීමාවකට වරක්ද යන වග : අවශ්‍යතාවය පරිදි

ඇමුණුම 02

<u>මධ්‍යම පළාත් ආයුර්වේද දෙපාර්තමේන්තුවේ ප්‍රාථමික - අර්ධ ශිල්පීය සේවා ගණයේ</u>
<u>බඳවා ගැනීමේ හා උසස් කිරීමේ පරිපාටියෙහි</u>
<u>I වන කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය</u>

බඳවා ගැනීමේ හා උසස් කිරීමේ පරිපාටියෙහි 8.1 වගන්තිය අදාළ වේ.

01. මෙම කාර්යක්ෂමතා කඩඉම ලිඛිත පරීක්ෂණයකි.

02. විභාගය පවත්වනු ලබන බලධාරයා: මධ්‍යම පළාත් සෞඛ්‍ය හා දේශීය වෛද්‍ය විෂය භාර අමාත්‍යාංශයේ ලේකම්

03. සාමාර්ථය සඳහා ලකුණු 40%ක් ලබාගත යුතුය.

04. පරීක්ෂණය වසරකට දෙවතාවක් පවත්වනු ලැබේ.

05. ලකුණු ලබා දෙන විෂය නිර්දේශය පහත සඳහන් පරිදි වේ.

| ප්‍රශ්න පත්‍රයේ නම | විෂය නිර්දේශය | කාලය | මුළු ලකුණු | සමත් ලකුණු |
|---|---|---|---|---|
| විෂයය දැනුම | අදාළ සේවකයා වෙත ඒ ඒ තනතුරට අදාළව පැවරෙන කාර්යයන් පිළිබඳ අවශ්‍ය වන පරිදි විෂය දැනුම ලබා ඇත්දැයි මැන බැලීම.<br>(වෘත්තියට අදාළ කාර්ය පිළිබඳ න්‍යායාත්මක දැනුම ආරක්ෂාව, වෘත්තීය සෞඛ්‍ය පිළිබඳ දැනුම,රෝගීන්ගේ හා සේවක ආහාර සැපයීම, ආපදා කළමනාකරණය, අපද්‍රව්‍ය කළමනාකරණය, රෝහල් පරිසරය හා සාමාන්‍ය ආයතනික කටයුතු යනාදි විෂයයන් ආවරණය වන සේ සකස් කළ බහුවරණ හා ව්‍යුහගත ප්‍රශ්න පත්‍රයකි.) | පැය එකයි | 100 | 40% |

ගරු ආණ්ඩුකාරතුමිය විසින්
2018.03.30 දින
අනුමත කරන ලදී.
ආණ්ඩුකාර ලේකම්

**ආයුර්වේද දෙපාර්තමේන්තුවේ ප්‍රාථමික - අර්ධ ශිල්පීය සේවා ගණයේ**
**බඳවා ගැනීමේ හා උසස් කිරීමේ පරිපාටියෙහි**
**II වන කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය**

බඳවා ගැනීමේ හා උසස් කිරීමේ පරිපාටියෙහි 8.1 වගන්තිය අදාළ වේ.

01. මෙම කාර්යක්ෂමතා කඩඉම ලිඛිත පරීක්ෂණයකි.

02. විභාගය පවත්වනු ලබන බලධාරයා: මධ්‍යම පළාත් සෞඛ්‍ය හා දේශීය වෛද්‍ය විෂය භාර අමාත්‍යාංශයේ ලේකම්

03. සාමාර්ථය සඳහා ලකුණු 40%ක් ලබාගත යුතුය.

04. පරීක්ෂණය වසරකට දෙවතාවක් පවත්වනු ලැබේ.

05. ලකුණු ලබා දෙන විෂය නිර්දේශය පහත සඳහන් පරිදි වේ.

| ප්‍රශ්න පත්‍රයේ නම | විෂය නිර්දේශය | කාලය | මුළු ලකුණු | සමත් ලකුණු |
|---|---|---|---|---|
| ආයතන සංග්‍රහය හා මුදල් රෙගුලාසි | 1.ආයතන සංග්‍රහයේ හා මුදල් රෙගුලාසි සම්බන්ධයෙන් පහත කරුණු.<br>• සේවයට බඳවා ගැනීම, මාරු කිරීම, නිවාඩු දුම්රිය බලපත්‍ර, ආරක්ෂක ඇඳුම් හා නිල ඇඳුම් සුභ සාධන පහසුකම් වෘත්තීය සමිති සංගම්වල සාමාජිකයන්ට අනුග්‍රහයන්,<br>• සේවය අවසන් කිරීම, නිවාඩු දින සඳහා වැටුප් හා දීමනා, ගමන් වියදම්, වැටුප් ණය හා අත්තිකාරම්, බලය දීම, අනුමත කිරීම, සහතික කිරීම, ගෙවීම,පාඩු හා අත්හැර දැමීම.<br>(බහුවරණ හා ව්‍යුහගත ප්‍රශ්න පත්‍රයකි) | පැය දෙකයි | 100 | 40% |
| තනතුරට අදාළ විෂය දැනුම | රාජකාරියට අදාළ විෂය දැනුම<br>• වෘත්තියෙහි නිතර භාවිතා කරන උපකරණවල නම් ඒවා තබා ගන්නා පිළිවෙළ තනතුරට පැවරෙන විවිධ කාර්යයන් පිළිබඳ ප්‍රමාණවත් දැනුමක් හා ප්‍රවීණතාවය අත්පත් කර ගෙන ඇත්දැයි බැලීම.<br>• (බහුවරණ හා ව්‍යුහගත ප්‍රශ්න පත්‍රයකි) | පැය එකයි | 100 | |

ගරු ආණ්ඩුකාරතුමිය විසින්
2018.03.30 දින
අනුමත කරන ලදී.
ආණ්ඩුකාර ලේකම්

**මධ්‍යම පළාත් ආයුර්වේද දෙපාර්තමේන්තුවේ ප්‍රාථමික - අර්ධ ශිල්පීය සේවා ගණයේ**
**බඳවා ගැනීමේ හා උසස් කිරීමේ පරිපාටියෙහි**
**III වන කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය**

බඳවා ගැනිමේ හා උසස් කිරිමේ පරිපාටියෙහි 8.1 වගන්තිය අදාළ වේ.

01. මෙම කාර්යක්ෂමතා කඩඉම ලිඛිත පරීක්ෂණයකි.
02. විභාගය පවත්වනු ලබන බලධාරයා: මධ්‍යම පළාත් සෞඛ්‍ය හා දේශීය වෛද්‍ය විෂය භාර අමාත්‍යාංශයේ ලේකම්
03. සාමාර්ථය සඳහා ලකුණු 40%ක් ලබාගත යුතුය.
04. පරීක්ෂණය වසරකට දෙවතාවක් පවත්වනු ලැබේ.
05. ලකුණු ලබා දෙන විෂය නිර්දේශය පහත සඳහන් පරිදි වේ.

| ප්‍රශ්න පත්‍රයේ නම | විෂය නිර්දේශය | කාලය | මුළු ලකුණු | සමත් ලකුණු |
|---|---|---|---|---|
| රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්ය පටිපාටික රීති සහ ආයතන සංග්‍රහය | රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්ය පටිපාටික රීති සංග්‍රහයේ පහත කරුණු<br>• පත් කිරිම, පරිවාස කාලය, වැඩ බැලීමේ කාලය හා පත්වීම් ස්ථිර කිරිම, කාර්යක්ෂමතා කඩඉම් හා වෘත්තිය සමිති කටයුතු.<br>• ආයතන සංග්‍රහයේ පහත කරුණු-සේවයට බඳවා ගැනිම, මාරු කිරිම, නිවාඩු, දුම්රිය බලපත්‍ර ,ආරක්ෂක ඇඳුම් හා නිල ඇඳුම් සුභ සාධන පහසුකම්, වෘත්තිය සමිති සංගම්වල සාමාජිකයන්ට අනුග්‍රහයන්<br>(බහුවරණ හා ව්‍යුහගත ප්‍රශ්න පත්‍රයකි) | පැය දෙකයි | 100 | 40% |

ගරු ආණ්ඩුකාරතුමිය විසින්
2018.03.30 දින
අනුමත කරන ලදී
ආණ්ඩුකාර ලේකම්

ඇමුණුම 05

<u>මධ්‍යම පළාත් සභාවේ ආයුර්වේද දෙපාර්තමේන්තුවේ</u>

<u>ප්‍රාථමික ශ්‍රේණියේ අර්ධ ශිල්පීය (PL 2)- සේවා ගණය</u>

<u>III වන ශ්‍රේණියේ සිට II ශ්‍රේණියට උසස් කිරීම සඳහා වූ අයදුම්පත්‍රය</u>

බඳවාගැනීමේ හා උසස් කිරීමේ පරිපාටියෙහි 10.1.1.2 වගන්තිය අදාළ වේ.

I කොටස (නිලධාරියා විසින්ම සම්පූර්ණ කළ යුතුය)

1. සම්පූර්ණ නම:............................................................................ මයා/මිය/මෙනවිය
2. මුලකුරු සමඟ නම:..................................................................... මයා/මිය/මෙනවිය
3. මුලකුරු වලින් හැඳින්වෙන නම්:.......................................................................
4. උපන් දිනය: .......................................................................................
5. ජාතික හැඳුනුම්පත් අංකය: ........................................................................
6. දැනට දරණ තනතුර: ...............................................................................
7. දැනට සේවය කරන සේවා ස්ථානය: ...............................................................
8. මුල් පත්වීම් ලිපියේ අංකය හා මුල් පත්වීම් දිනය:...........................................
9. පත්වීම ස්ථිර කළ දිනය : ........................................................................
10. සේවයේ වසර දහය (10) සම්පූර්ණ කළ
    දිනය.........................................................................................
11. කාර්යක්ෂමතා කඩඉම් විභාගය සමත් වූ
    දිනය.........................................................................................
12. අනෙක් රාජ්‍ය භාෂා ප්‍රවීණතාවය ලබාගත් දිනය...............................................

මා විසින් ඉහත සඳහන් කර ඇති සියලුම තොරතුරු සත්‍ය හා නිවැරදි බව මෙයින් සහතික කරමි.

දිනය : ...................................                                    ...................................

අයදුම්කරුගේ අත්සන

ගරු ආණ්ඩුකාරතුමිය විසින්
2018.03.30 දින
අනුමත කරන ලදී.
ආණ්ඩුකාර ලේකම්

11 කොටස

(පෞද්ගලික ලිපි ගොනුව භාරව සිටින නිලධාරියා විසින් සම්පූර්ණ කළ යුතු අතර අදාළ තොරතුරු සනාථ කිරීම සඳහා අදාළ ලිපි ලේඛන ඇමිණිය යුතුය.)

දෙපාර්තමේන්තු ප්‍රධානියා වෙත,

යන්ත්‍ර ක්‍රියාකරු/ සුළුසේවා පාලක/ආහාර නිරීක්ෂිකා/ ආයුර්වේද ඖෂධ සංයෝජක/උපස්ථායක ලෙස සේවයකරන.............................................................මහතා/මහත්මිය/මෙනවිය විසින් ඉහත සඳහන් කර ඇති තොරතුරු ඔහුගේ/ඇයගේ පෞද්ගලික ලිපි ගොනුවට අනුව නිවැරදිය.

1. යන්ත්‍ර ක්‍රියාකරු/ සුළු සේවා පාලක/ ආහාර නිරීක්ෂිකා/ආයුර්වේද ඖෂධ සංයෝජක / උපස්ථායක ස්ථිර විශ්‍රාම වැටුප් සහිත තනතුරට පත්වූ දිනය: ................

2.යන්ත්‍ර ක්‍රියාකරු / සුළුසේවා පාලක/ආහාර නිරීක්ෂිකා/ආයුර්වේද ඖෂධ සංයෝජක/ උපස්ථායක තනතුරේ වසර දහය(10) සම්පූර්ණ කළ දිනය : ..............

2. අනුමත කාර්ය සාධන ඇගයීමේ පරිපාටිය අනුව උසස්වීමේ දිනය පෙරාතුව වූ වසර 10 තුළ සතුටුදායක මට්ටමේ හෝ ඊට ඉහළ කාර්ය සාධනයක් පෙන්නුම් කර ඇත. / නැත.

4 උසස් කිරීමේ දිනට පූර්වාසන්න වසර 05ක සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම.

5 කාර්යක්ෂමතා කඩඉම් විභාගය සමත් වූ දිනය..............................................................

6 අනෙක් රාජ්‍ය භාෂා ප්‍රවීණතාවය ලබා ගත් දිනය..............................................................

ඉහත සඳහන් සියලු තොරතුරු සත්‍ය හා නිවැරදි බවත්, විනය පරීක්ෂණයක් නොමැති බවත්,........................... දින සිට සාමාන්‍ය කාර්ය සාධනය යටතේ II ශ්‍රේණියට උසස්වීමට අදාළ සුදුසුකම් සපුරා ඇති බවත් සහතික කරමි.

දිනය : ..................................

..........................................

විෂය භාර නිලධරයාගේ අත්සන

දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ නිර්දේශය

මෙම සේවක මහතා / මහත්මිය අදාළ සියළුම සුදුසුකම් සම්පූර්ණ කර ඇත./නැත. එබැවින් ......................... දින සිට .......................... II ශ්‍රේණියට උසස්වීමකිරීම නිර්දේශ කරමි/. .............................................හේතු මත නිර්දේශ නොකරමි.

දිනය:-.............................................

දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ අත්සන

නම : .......................................

පදවි නාමය : ..........................................

(නිල මුද්‍රාව තබන්න)

අමාත්‍යාංශ ලේකම්ගේ නිර්දේශය

.............................................................................. සේවක මහතා / මහත්මිය සියලු සුදුසුකම් සම්පූර්ණ කර ඇත./නැත. එබැවින් ......................... දින සිට ..........................ශ්‍රේණියට උසස් කිරීම අනුමත කරමි. / අනුමත නොකරමි.

දිනය : ..................................

.................................................................

අමාත්‍යාංශ ලේකම්ගේ අත්සන

නම : ..........................................

පදවි නාමය : ..............................................

(නිල මුද්‍රාව තබන්න)

ගරු ආණ්ඩුකාරතුමිය විසින්
2018.03.30 දින
අනුමත කරන ලදී.
ආණ්ඩුකාර ලේකම්

ඇමුණුම 06

<u>මධ්‍යම පළාත් සභාවේ ආයුර්වේද දෙපාර්තමේන්තුවේ</u>
<u>ප්‍රාථමික ශ්‍රේණියේ අර්ධ ශිල්පීය (PL 2) - සේවා ගණය</u>
<u>II වන ශ්‍රේණියේ සිට I ශ්‍රේණියට උසස් කිරීම සඳහා වූ අයදුම්පත්‍රය</u>

බඳවාගැනීමේ හා උසස් කිරීමේ පරිපාටියෙහි 10.2.1.2 වගන්තිය අදාළ වේ

1.කොටස (නිලධාරියා විසින්ම සම්පූර්ණ කළ යුතුය)

01 .සම්පූර්ණ නම: ......................................................................................මයා/මිය/මෙනවිය
02. මුලකුරු සමඟ නම: ................................................................................මයා/මිය/මෙනවිය
03. මුලකුරු වලින් හැඳින්වෙන නම:.........................................................................
04. උපන් දිනය:.........................................................................................
05. ජාතික හැඳුනුම්පත් අංකය: ...............................................................................
06. දැනට දරණ තනතුර::.........................................................................................
07. දැනට සේවය කරන සේවා ස්ථානය: ...................................................................
08.මුල් ස්ථිර පත්වීම් ලිපියේ අංකය හා මුල් පත්වීම් දිනය:.........................................
09. පත්වීම ස්ථිර කළ දිනය: ..................................................................................
10. II ශ්‍රේණියේ වසර නවය (09) සම්පූර්ණ දිනය.........................................................
11. නියමිත කාර්යක්ෂමතා කඩඉම් විභාගය සමත් වූ දිනය:..........................................
12. අනෙක් රාජ්‍ය භාෂා ප්‍රවීණතාවය ලබාගත් දිනය ......................................................

මා විසින් ඉහත සඳහන් කර ඇති සියලුම තොරතුරු සත්‍ය හා නිවැරදි බව මෙයින් සහතික කරමි.

දිනය : ....................................

....................................
අයදුම්කරුගේ අත්සන

ගරු ආණ්ඩුකාරතුමිය විසින්
2018.03.30 ........................ දින
අනුමත කරන ලදී.
ආණ්ඩුකාර ලේකම්

11 කොටස

(පෞද්ගලික ලිපි ගොනුව භාරව සිටින නිලධාරියා විසින් සම්පූර්ණ කළ යුතු අතර අදාළ තොරතුරු සනාථ කිරීම සඳහා අදාළ ලිපි ලේඛන ඇමිණිය යුතුය.)

දෙපාර්තමේන්තු ප්‍රධානියා වෙත,

යන්ත්‍ර ක්‍රියාකරු/ සුළු සේවා පාලක/ ආහාර නිරීක්ෂිකා/ආයුර්වේද ඖෂධ සංයෝජක / උපස්ථායක ලෙස සේවය කරන.........................................................................මහතා/මහත්මිය/මෙනවිය විසින් ඉහත සඳහන් කර ඇති තොරතුරු ඔහුගේ/ඇයගේ පෞද්ගලික ලිපි ගොනුවට අනුව නිවැරදිය.

1. යන්ත්‍ර ක්‍රියාකරු/ සුළු සේවා පාලක/ ආහාර නිරීක්ෂිකා/ආයුර්වේද ඖෂධ සංයෝජක / උපස්ථායක තනතුර ස්ථිර විශ්‍රාම වැටුප් සහිත තනතුරට පත්වූ දිනය: ..........................................................
2. යන්ත්‍ර ක්‍රියාකරු/ සුළු සේවා පාලක/ ආහාර නිරීක්ෂිකා/ආයුර්වේද ඖෂධ සංයෝජක / උපස්ථායක තනතුරේ වසර නවය (09) සම්පූර්ණ කළ දිනය : ..........................................
3. නියමිත කාර්යක්ෂමතා කඩඉම් විභාගය සමත් වූ දිනය:.............................................................
4. උසස් කිරීමේ දිනට පූර්වාසන්න වසර 05ක සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම.
5. අනුමත කාර්ය සාධන ඇගයීමේ පරිපාටිය අනුව උසස්වීමේ දිනට පෙරාතුව වූ වසර 09 තුළ සතුටුදායක මට්ටමේ හෝ ඊට ඉහළ කාර්ය සාධනයක් පෙන්නුම් කර ඇත. / නැත.

ඉහත සඳහන් සියලු තොරතුරු සත්‍ය හා නිවැරදි බවත්, විනය පරීක්ෂණයක් නොමැති බවත්, ............................... දින සිට I ශ්‍රේණියට උසස්වීමට අදාළ සුදුසුකම් සපුරා ඇති බවත් සහතික කරමි

දිනය : ....................................

.........................................

විෂය භාර නිලධරයාගේ අත්සන

දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ නිර්දේශය

මෙම සේවක මහතා/ සේවක මහත්මිය අදාළ සියළුම සුදුසුකම් සම්පූර්ණ කර ඇත./නැත. එබැවින් .......................... දින සිට .......................... IIශ්‍රේණියට උසස් කිරීම නිර්දේශ කරමි../
.......................................................හේතු මත නිර්දේශ නොකරමි.

දිනය:-..............................................

දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ අත්සන
නම : ..................................................
පදවි නාමය : ..............................................
(නිල මුද්‍රාව තබන්න)

6. අමාත්‍යාංශ ලේකම්ගේ නිර්දේශය

........................................................................ සේවක මහතා/ සේවක මහත්මිය සියලු සුදුසුකම් සම්පූර්ණ කර ඇත./නැත. එබැවින් .......................... දින සිට ............................ශ්‍රේණියට උසස් කිරීම අනුමත කරමි. / අනුමත නොකරමි.

දිනය : ....................................

..........................................................................

අමාත්‍යාංශ ලේකම්ගේ අත්සන
නම : ..........................................
පදවි නාමය : .........................................
(නිල මුද්‍රාව තබන්න)

ගරු ආණ්ඩුකාරතුමිය විසින්
2018.03.30 දින
අනුමත කරන ලදී.
ආණ්ඩුකාර ලේකම්

ඇමුණුම 07

<u>මධ්‍යම පළාත් සභාවේ ආයුර්වේද දෙපාර්තමේන්තුවේ</u>
<u>ප්‍රාථමික ශ්‍රේණියේ අර්ධ ශිල්පීය (PL 2) - සේවා ගණය</u>
<u>I වන ශ්‍රේණියේ සිට විශේෂ ශ්‍රේණියටඋසස් කිරීම සඳහා වූ අයදුම්පත්‍රය</u>

1.කොටස (නිලධාරියා විසින්ම සම්පූර්ණ කළ යුතුය)

01 .සම්පූර්ණ නම:.......................................................................................................

02. මුලකුරු සමඟ නම:.................................................................................. මයා/මිය/මෙනවිය

03. මුලකුරු වලින් හැඳින්වෙන නම:...........................................................................

04. උපන් දිනය: ......................................................................................................

05. ජාතික හැඳුනුම්පත් අංකය: .......................................................................................

06. දැනට දරණ තනතුර: ................................................................................................

07. දැනට සේවය කරන සේවා ස්ථානය: ..........................................................................

08.මුල් ස්ථිර පත්වීම් ලිපියේ අංකය හා මුල් පත්වීම් දිනය.....................................................

09. පත්වීම ස්ථිර කළ දින: ..............................................................................................

10. Iශ්‍රේණියේ වසර නවය (09) සම්පූර්ණ දිනය...........................................................

11. නියමිත කාර්යක්ෂමතා කඩඉම් විභාගය සමත් වූ දිනය:.......................................................

12. අනෙක් රාජ්‍ය භාෂා ප්‍රවීණතාවය ලබා ගත් දිනය : ..........................................................

මා විසින් ඉහත සඳහන් කර ඇති සියලුම තොරතුරු සත්‍ය හා නිවැරදි බව මෙයින් සහතික කරමි.

දිනය : .................................

.................................
අයදුම්කරුගේ අත්සන

ගරු ආණ්ඩුකාරතුමිය විසින්
2018.03.30 දින
අනුමත කරන ලදී.
ආණ්ඩුකාර ලේකම්

11 කොටස

(පෞද්ගලික ලිපි ගොනුව භාරව සිටින නිලධාරියා විසින් සම්පූර්ණ කළ යුතු අතර අදාළ තොරතුරු සනාථ කිරීම සඳහා අදාළ ලිපි ලේඛන ඇමිණිය යුතුය.)

දෙපාර්තමේන්තු ප්‍රධානියා වෙත,

01.යන්ත්‍ර ක්‍රියාකරු/ සුළු සේවා පාලක/ ආහාර නිරීක්ෂිකා/ආයුර්වේද ඖෂධ සංයෝජක / උපස්ථායක ලෙස සේවය කරන.......................................................මහතා/මහත්මිය/මෙනවිය විසින් ඉහත සඳහන් කර ඇති තොරතුරු ඔහුගේ/ඇයගේ පෞද්ගලික ලිපි ගොනුවට අනුව නිවැරදිය.

02.යන්ත්‍ර ක්‍රියාකරු/ සුළු සේවා පාලක/ ආහාර නිරීක්ෂිකා/ආයුර්වේද ඖෂධ සංයෝජක / උපස්ථායක තනතුර ස්ථිර විශ්‍රාම වැටුප් සහිත තනතුරට පත්වූ දිනය: .........................................................................

03.යන්ත්‍ර ක්‍රියාකරු/ සුළු සේවා පාලක/ ආහාර නිරීක්ෂිකා/ආයුර්වේද ඖෂධ සංයෝජක / උපස්ථායක තනතුරේ වසර නවය(09) සම්පූර්ණ කළ දිනය : .......................................................................

04. නියමිත කාර්යක්ෂමතා කඩඉම් විභාගය සමත් වූ දිනය:.........................................................................

05. උසස් කිරීමේ දිනට පූර්වාසන්න වසර 05ක සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම

06. අනුමත කාර්ය සාධන ඇගයීමේ පරිපාටිය අනුව උසස්වීමේ දිනට පෙරාතුව වූ වසර 09 තුළ සතුටුදායක මට්ටමේ හෝ ඊට ඉහළ කාර්ය සාධනයක් පෙන්නුම් කර ඇත. / නැත.

ඉහත සඳහන් සියලු තොරතුරු සත්‍ය හා නිවැරදි බවත්, විනය පරීක්ෂණයක් නොමැති බවත්, ............................ දින සිට විශේෂ ශ්‍රේණියට උසස් වීමට අදාළ සුදුසුකම් සපුරා ඇති බවත් සහතික කරමි.

දිනය : ...................................

...........................................
විෂය භාර නිලධරයාගේ අත්සන

දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ නිර්දේශය

මෙම සේවක මහතා /සේවක මහත්මිය අදාළ සියළු සුදුසුකම් සම්පූර්ණ කර ඇත./නැත. එබැවින් .................... දින සිට .................... විශේෂ ශ්‍රේණියට උසස් කිරීම නිර්දේශ කරමි./..................................................හේතු මත නිර්දේශ නොකරමි.

දිනය:-...........................................

දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ අත්සන
නම : ..........................................
පදවි නාමය : ..........................................
(නිල මුද්‍රාව තබන්න)

අමාත්‍යාංශ ලේකම්ගේ නිර්දේශය

.......................................................... සේවක මහතා /සේවක මහත්මිය සියලු සුදුසුකම් සම්පූර්ණ කර ඇත./නැත. එබැවින් ....................... දින සිට ............................ශ්‍රේණියට උසස් කිරීම අනුමත කරමි. / අනුමත නොකරමි.

දිනය : ...................................

.........................................................
අමාත්‍යාංශ ලේකම්ගේ අත්සන

නම : ...................................
පදවි නාමය : ...................................
(නිල මුද්‍රාව තබන්න)

ගරු ආණ්ඩුකාරතුමිය විසින්
2018.03.30 දින
අනුමත කරන ලදී.
ආණ්ඩුකාර ලේකම්

ඇමුණුම 08

<u>මධ්‍යම පළාත් සභාවේ ආයුර්වේද දෙපාර්තමේන්තුවේ</u>
<u>ප්‍රාථමික ශ්‍රේණියේ අර්ධ ශිල්පීය (PL 2) - සේවා ගණය</u>
<u>III/II/I/විශේෂ ශ්‍රේණියට අන්තර්ග්‍රහණය කිරීම සඳහා වූ අයදුම් පත්‍රය</u>

1 කොටස (නිලධාරියා විසින්ම සම්පූර්ණ කළ යුතුය)

1. සම්පූර්ණ නම : ........................................................ මයා/මිය/මෙනවිය
2. මුලකුරු සමඟ නම : ........................................................ මයා/මිය/මෙනවිය
3. මුලකුරු වලින් හැඳින්වෙන නම් : ........................................................
4. උපන් දිනය : ........................................................
5. ජාතික හැඳුනුම්පත් අංකය : ........................................................
6. දැනට සේවය කරන සේවා ස්ථානය : ........................................................
7. මුල් පත්වීම් ලිපියේ අංකය හා මුල් පත්වීම් දිනය: ........................................................
8. මධ්‍යම පළාත් රාජ්‍ය සේවයට අන්තර්ග්‍රහණය වූ දිනය : ........................................................
9. පත්වීම ස්ථිර කළ දිනය : ........................................................
10. බඳවා ගැනීමේ පරිපාටිය අනුමත කරන දිනට මුළු සේවා කාලය: ........................................................
11. බඳවා ගැනීමේ පරිපාටිය අනුමත කරන දිනට වැටුප් පියවර........................................................
12. නව බඳවා ගැනීමේ පරිපාටිය අනුව අන්තර්ග්‍රහණය වීමට අයදුම් කරන ශ්‍රේණිය: ......................

මා විසින් ඉහත සඳහන් කර ඇති සියලුම තොරතුරු සත්‍ය හා නිවැරදි බව මෙයින් සහතික කරමි. මධ්‍යම පළාත් සභාවේ ආයුර්වේද දෙපාර්තමේන්තුවේ ප්‍රාථමික ශ්‍රේණියේ අර්ධ ශිල්පීය (PL 2) - සේවා ගණයට අන්තර්ග්‍රහණය වීමට මනාපය ප්‍රකාශ කරමි/ නොකරමි.

දිනය : ..................................

..................................
අයදුම්කරුගේ අත්සන

ගරු ආණ්ඩුකාරතුමිය විසින්
2018.03.30 දින
අනුමත කරන ලදී.
ආණ්ඩුකාර ලේකම්

11 කොටස

(පෞද්ගලික ලිපි ගොනුව භාරව සිටින නිලධාරියා විසින් සම්පූර්ණ කළ යුතු අතර අදාළ තොරතුරු සනාථ කිරීම සඳහා අදාළ ලිපි ලේඛන ඇමිණිය යුතුය.)

දෙපාර්තමේන්තු ප්‍රධානියා වෙත,

යන්ත්‍ර ක්‍රියාකරු/ සුළු සේවා පාලක/ ආහාර නිරීක්ෂිකා/ආයුර්වේද ඖෂධ සංයෝජක / උපස්ථායක ලෙස සේවය කරන ..........................................................................................

මහතා/මහත්මිය/මෙනවිය විසින් ඉහත සඳහන් කර ඇති තොරතුරු ඔහුගේ/ඇයගේ පෞද්ගලික ලිපි ගොනුවට අනුව නිවැරදිය.

1. යන්ත්‍ර ක්‍රියාකරු/ සුළු සේවා පාලක/ ආහාර නිරීක්ෂිකා/ආයුර්වේද ඖෂධ සංයෝජක / උපස්ථායක තනතුර ස්ථිර විශ්‍රාම වැටුප් සහිත තනතුරට පත්වූ දිනය : ...............................

ඉහත සඳහන් සියලු තොරතුරු සත්‍ය හා නිවැරදි බවත්,.............................. දින ............... ශ්‍රේණියට අන්තර්ග්‍රහණය වීමට අදාළ සුදුසුකම් සපුරා ඇති බවත් සහතික කරමි.

දිනය : .................................

..............................................

විෂය භාර නිලධරයාගේ අත්සන

දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ නිර්දේශය

මෙම සේවක මහතා/සේවක මහත්මිය සියලු සුදුසුකම් සම්පූර්ණ කර ඇත./නැත. එබැවින් .......................... දින සිට ............................ ශ්‍රේණියට අන්තර්ග්‍රහණය කිරීම කිරීම නිර්දේශ කරමි./නොකරමි.

දිනය : .................................

දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ අත්සන

නම : ..............................................

පදවි නාමය : ....................................

(නිල මුද්‍රාව තබන්න)

අමාත්‍යාංශ ලේකම්ගේ අනුමැතිය

.................................................................... සේවක මහතා/සේවක මහත්මිය සියලු සුදුසුකම් සම්පූර්ණකර ඇත./නැත. එබැවින් ........................ දින සිට ...........................ශ්‍රේණියට අන්තර්ග්‍රහණය කිරීම අනුමත කරමි. / අනුමත නොකරමි.

දිනය : .................................

..............................................................

අමාත්‍යාංශ ලේකම්ගේ අත්සන

නම : .......................................

පදවි නාමය : .......................................

(නිල මුද්‍රාව තබන්න)

ගරු ආණ්ඩුකාරතුමිය විසින්
2018.03.30 දින
අනුමත කරන ලදී.
ආණ්ඩුකාර ලේකම්

ඇමුණුම 09

සේවයේ යෙදී සිටින්නන් නව ශ්‍රේණි ක්‍රමය සඳහා අන්තර්ග්‍රහණය කිරීම
(බඳවා ගැනීමේ පරිපාටිය ක්‍රියාත්මක වන දිනට සේවයේ යෙදී සිටින්නන්ට පමණක් අදාළ වේ.)

❖ නව බඳවා ගැනීම් පරිපාටිය ක්‍රියාත්මක වන දිනට රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක : 03/2016 මගින් ලබාදී ඇති PL 2 - 2016 වැටුප් පරිමාණය යටතේ වැටුප් ලබන සේවකයින් සියලු දෙනාම පහත සඳහන් පරිදි ශ්‍රේණි ක්‍රමයට අන්තර්ග්‍රහණය කරනු ලැබේ. සේවා කාලය ගණන් ගත යුත්තේ එම ශ්‍රේණියට පත් කරන ලද දිනය පදනම් කර ගෙනය. කෙසේ වුවත් අන්තර්ග්‍රහණයට පෙර පැවති වැටුප් වර්ධක දිනය වශයෙන් නොවෙනස්ව ක්‍රියාත්මක විය යුතුය. එසේම වැටුප් පරිවර්තනයේදී අදාළ තැනැත්තා අවසන් වරට ලබමින් සිටි වැටුප් පියවර අනුරූපී වීම මත ආයතන සංග්‍රහයේ VII පරිච්ඡේදයේ 4.4 වගන්තිය අනුව ඊළඟ වැටුප් පියවරේ තැබීම ද සිදු නොකළ යුතුය.

(i) PL 2-III ශ්‍රේණිය

(අ) PL 2 – 2016 වැටුප් පරිමාණයෙහි III ශ්‍රේණියට අදාළ වැටුප් පියවර ලබා දී ඇති තනතුරක හෝ ශ්‍රේණියක යටත් පිරිසෙයින් අවුරුදු දහය( 10)ක සේවා කාලයක් සම්පූර්ණ කර නැති සේවකයින්

(ආ) PL 2 –2016 වැටුප් පරිමාණයෙහි III ශ්‍රේණියට අදාළ වැටුප් පියවර ලබා දී ඇති තනතුරක හෝ ශ්‍රේණියක යටත් පිරිසෙයින් අවුරුදු දහය( 10) ක හෝ ඊට වැඩි සේවා කාලයක් සම්පූර්ණ වුවද II ශ්‍රේණියට අන්තර්ග්‍රහණය කිරීමට අවශ්‍ය සෙසු සුදුසුකම් සපුරා නොමැති සේවකයින් PL 2- III ශ්‍රේණියට අන්තර්ග්‍රහණය කෙරේ.

(ii) PL 2- II ශ්‍රේණිය

(අ) PL 2- 2016 වැටුප් පරිමාණයෙහි III ශ්‍රේණියට අදාළ වැටුප් පියවර ලබා දී ඇති තනතුරක හෝ ශ්‍රේණියක යටත් පිරිසෙයින් අවුරුදු 10ක හෝ ඊට වැඩි, එහෙත් අවුරුදු 19 නොවැඩි සක්‍රිය හා සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර ඇති එමෙන්ම නව බඳවා ගැනීමේ පරිපාටිය ක්‍රියාත්මක වීමට පෙර ක්‍රියාත්මකව පැවති බඳවා ගැනීමේ පරිපාටියට අනුව අවශ්‍ය සෙසු සුදුසුකම් සපුරා ඇති සේවකයින්.

(ආ) PL 2 – 2016 වැටුප් පරිමාණයෙහි II ශ්‍රේණියට අදාළ වැටුප් පියවර ලබා දී ඇති තනතුරක හෝ ශ්‍රේණියක යටත් පිරිසෙයින් අවුරුදු නවය( 9)ක සේවා කාලයක් සම්පූර්ණ කර නැති සේවකයින්.

(ඇ) PL 2-2016 වැටුප් පරිමාණයෙහි II ශ්‍රේණියට අදාළ වැටුප් පියවර ලබා දී ඇති තනතුරක හෝ ශ්‍රේණියක සේවා කාලය වසර නවය( 09) ක් සම්පූර්ණ වුවද නව බඳවා ගැනීම් පරිපාටිය ක්‍රියාත්මක වන දිනට පෙර ක්‍රියාත්මකව පැවති බඳවා ගැනීම් පරිපාටිය අනුව I ශ්‍රේණියට උසස් වීමට අවශ්‍ය සෙසු සුදුසුකම් සපුරා නොමැති සේවකයින්.

PL 2- II ශ්‍රේණියට අන්තර්ග්‍රහණය කෙරේ.

ගරු ආණ්ඩුකාරතුමිය විසින්
2018.03.30 දින
අනුමත කරන ලදී.
ආණ්ඩුකාර ලේකම්

(iii) PL 2- I ශ්‍රේණිය

(අ) PL 2-2016 වැටුප් පරිමාණයෙහි III ශ්‍රේණියට අදාළ වැටුප් පියවර ලබා දී ඇති තනතුරක හෝ ශ්‍රේණියක යටත් පිරිසෙයින් අවුරුදු දහනවයක (19) හෝ ඊට වැඩි, එහෙත් අවුරුදු 28කට අඩු සේවා කාලයක් සම්පූර්ණ කර ඇති සේවකයන්.

(ආ) PL 2- 2016 වැටුප් පරිමාණයෙහි II ශ්‍රේණියට අදාළ වැටුප් පියවර ලබා දී ඇති තනතුරක හෝ ශ්‍රේණියක යටත් පිරිසෙයින් අවුරුදු නවයක් (09) හෝ ඊට වැඩි, එහෙත් අවුරුදු දහනවයකට (19 අඩු සේවා කාලයක් සම්පූර්ණ කර ඇති, එමෙන්ම අදාළ කාලය තුළ වැටුප් වර්ධක නවයක් (09)ක් උපයාගෙන ඇති හා ඉහත සඳහන් අනෙකුත් සේවා අවශ්‍යතා සපුරා ඇති සේවකයන්.

(ඇ) PL 2 – 2016 වැටුප් පරිමාණයෙහි I ශ්‍රේණියට අදාළ වැටුප් පියවර ලබා දී ඇති තනතුරක හෝ ශ්‍රේණියක යටත් පිරිසෙයින් අවුරුදු නවයක (9) සේවා කාලයක් සම්පූර්ණ කර නැති සේවකයින්.

(ඈ) PL 2- 2016 වැටුප් පරිමාණයෙහි I ශ්‍රේණියට අදාළ වැටුප් පියවර ලබා දී ඇති තනතුරක හෝ ශ්‍රේණියක සේවා කාලය වසර නවයක් (09) සම්පූර්ණ වුවද විශේෂ ශ්‍රේණියට උසස් වීමට අවශ්‍ය සෙසු සුදුසුකම් සපුරා නොමැති සේවකයින්.

PL 2-I ශ්‍රේණියට අන්තර්ග්‍රහණය කෙරේ.

(iv) PL 2 - විශේෂ ශ්‍රේණිය

(අ) PL2-2016 වැටුප් පරිමාණයෙහි III ශ්‍රේණියට අදාළ වැටුප් පියවර ලබා දී ඇති තනතුරක හෝ ශ්‍රේණියක යටත් පිරිසෙයින් අවුරුදු විසිඅටක් (28) ඇති, එමෙන්ම අදාළ කාලය තුළ වැටුප් වර්ධක විසිඅටක් (28) උපයාගෙන ඇති හා නව බඳවාගැනීමේ පරිපාටිය ක්‍රියාත්මක වන දිනට පෙර ක්‍රියාත්මකව පැවති බඳවා ගැනීමේ පරිපාටිය අනුව අනෙකුත් සේවා අවශ්‍යතා සපුරා ඇති සේවකයින්.

(ආ) PL2-2016 වැටුප් පරිමාණයෙහි II ශ්‍රේණියට අදාළ වැටුප් පියවර ලබා දී ඇති තනතුරක හෝ ශ්‍රේණියක යටත් පිරිසෙයින් අවුරුදු දහනවයක (19) සේවා කාලයක් සම්පූර්ණ කර ඇති, එමෙන්ම අදාළ කාලය තුළ වැටුප් වර්ධක දහ නවයක් (19) උපයාගෙන ඇති හා ඉහත සඳහන් අනෙකුත් සේවා අවශ්‍යතා සපුරා ඇති සේවකයන්.

(ඇ) PL2-2016 වැටුප් පරිමාණයෙහි I ශ්‍රේණියට අදාළ වැටුප් පියවර ලබා දී ඇති තනතුරක හෝ ශ්‍රේණියක යටත් පිරිසෙයින් අවුරුදු නවයක (9) සේවා කාලයක් සම්පූර්ණ කර ඇති, එමෙන්ම අදාළ කාලය තුළ වැටුප් වර්ධක නවයක් (09) උපයාගෙන ඇති හා ඉහත සඳහන් අනෙකුත් සේවා අවශ්‍යතා සපුරා ඇති සේවකයන්.

(ඈ) PL 2 –2016 වැටුප් පරිමාණයෙහි විශේෂ ශ්‍රේණියට අදාළ වැටුප් පියවර ලබා දී ඇති තනතුරක වැටුප් ලබන සේවකයින්.

PL 2- විශේෂ ශ්‍රේණියට අන්තර්ග්‍රහණය කෙරේ.

- ඒ ශ්‍රේණියට අන්තර්ග්‍රහණය කිරීමේදී කාර්යක්ෂමතා කඩඉම සමත්විය යුතුව තිබූ කාලය ඉක්මවා තිබේ නම් අදාළ සේවකයා කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණයෙන් නිදහස් කරනු ලැබේ.

ගරු ආණ්ඩුකාරතුමිය විසින්
2018.03.30 දින
අනුමත කරන ලදී.
ආණ්ඩුකාර ලේකම්